2024-08-

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2024

## බුද්ධ ධර්මය

## 7 ශ්‍රේණිය

Learning Resource Center
R
De Mazenod College
Kandana

විභාග අංකය/නම ..............................

කාලය පැය 02 යි

### I කොටස

- 1 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) බුදුරජාණන් වහන්සේ සත් සතිය තුළ දෙවන සතිය ගත කළේ,
   (1) රුවන් සක්මනෙහි යෙදෙමින්
   (2) රුවන් ගෙයි වැඩ සිටිමින්
   (3) අනිමිස ලෝචන පූජාවෙහි යෙදෙමින්
   (4) රාජායතන කිරිපලු රුක මුල වැඩ සිටීමෙන්

2) පළමු දෙවාචික උපාසකවරුන් කවුද?
   (1) තපස්සු - භල්ලුක වෙළඳුන් ය.
   (2) පස්වග මහණුන් ය.
   (3) තුන්බෑ ජටිලයින් ය.
   (4) භද්දවග්ගිය කුමාරවරු ය.

3) බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ගේ ශාස්තෘවරයා වන නිසා
   (1) සුගත නම් වන සේක.
   (2) ලෝකවිදූ නම් වන සේක.
   (3) භගවා නම් වන සේක.
   (4) සත්ථා දේව මනුස්සානං නම් වන සේක.

4) කුෂ්ඨ රෝගයෙන් පීඩා විඳි භික්ෂූන් වහන්සේ වන්නේ,
   (1) ආනන්ද හිමි
   (2) පූතිගත්ත තිස්ස හිමි
   (3) සෝපාක හිමි
   (4) මුගලන් හිමි

5) ජේතවනාරාමය පූජා කරන ලද්දේ,
   (1) බිම්බිසාර රජතුමාය.
   (2) අනේපිඩු සිටුතුමාය.
   (3) විශාකා සිටු කුමරියය.
   (4) සුද්දෝධන රජතුමාය.

6) ආනන්ද බෝධිය පිහිටා ඇත්තේ,
   (1) වේළුවනාරාමයේ ය.
   (2) දෙවරම්වෙහෙරේ ය.
   (3) පූර්වාරාමයේ ය.
   (4) ගිජ්ඣකූළ පර්වතයේ ය.

7) මිගාර මාතා නමින් ප්‍රසිද්ධ වූයේ,
   (1) මහාප්‍රජාපතී ගෝතමී දේවිය ය.
   (2) කිසාගෝතමී දේවිය ය.
   (3) විශාඛා මහෝපාසිකාව ය.
   (4) යශෝධරා දේවිය ය.

8) සිගාලක ගෘහපතියාට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වූයේ,
   (1) දම්සක් පැවතුම් සූත්‍රය ය.
   (2) සිගාලෝවාද සූත්‍රය ය.
   (3) කරණීය මෙත්ත සූත්‍රය ය.
   (4) මහාමංගල සූත්‍රය ය.

9) සුනාපරන්තයට වැඩම කළ තෙරුන් වහන්සේ වූයේ,
   (1) මහාකාශ්‍යප තෙරුන්ය.
   (2) පුණ්ණ තෙරුන්ය.
   (3) අස්සජී තෙරුන්ය.
   (4) රේවත තෙරුන්ය.

10) පස්වග මහණුන් රහත් වූයේ කුමන සූත්‍රය ඇසීමෙන් ද?
   (1) දම්සක් පැවතුම් සූත්‍රය
   (2) චුල්ල හත්ථිපදෝපම සූත්‍රය
   (3) අනන්තලක්ඛණ සූත්‍රය
   (4) කරණීයමෙත්ත සූත්‍රය

❖ **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(නිත්‍ය සීලය, ඇම්.ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා, ධම්ම පදය, සහම්පති මහා බ්‍රහ්මයා, අටසිල්)

11) බෞද්ධයාගේ අත්පොත ........................................ යි.

12) පොහොය දින සමාදන් වන්නේ ........................................ වේ.

13) පංච ශීලය ගිහියාගේ ........................................ ලෙස හැඳින් වේ.

14) ලෝකයාට ධර්මය දේශනා කිරීමට බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේ ........................................ ය.

15) සිරිත් මල්දම රචනා කරන ලද්දේ ........................................ විසිනි.

❖ **පහත ප්‍රකාශන නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.**

16) බෝසතාණන් වහන්සේ සතුව පැවති ආදර්ශවත් නායකත්වය අපණ්ණක ජාතකයෙන් පිළිඹිබු වේ. (   )

17) පූර්වාරාමය සාදවන ලද්දේ විශාඛා මහෝපාසිකාව විසිනි. (   )

18) කුසලයෙහි නිරත වීම "විරතිය" ලෙස හඳුන්වයි. (   )

19) අවශ්‍ය කටයුතු භාර දීම, ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට විය යුතු යුතුකමකි. (   )

20) පිදිය යුත්තන් පිදීම මංගල කරුණකි. (   )

(ලකුණු 20 × 2 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර පළමු ප්‍රශ්නය ද ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය ට ලකුණු 20 කි. අනෙක් ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 60කි.**

1) දෙවන වාරයට අදාළව ඔබ විසින් පන්ති කාමරයේ කරනු ලැබූ ඇගයීම ඇසුරෙන් i සිට x දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

   i. ඇගයීම සිදුකළ පාඩමේ මාතෘකාව කුමක් ද?
   ii. ඇගයීම් සිදු කිරීමේ දී ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.
   iii. ඇගයීම සඳහා තොරතුරු සපයාගත් ආකාර දෙකක් නම් කරන්න.
   iv. ඇගයීම සිදු කිරීමේ දී ඔබට මතු වූ ගැටලු දෙකක් ලියන්න.
   v. මෙම ඇගයීමෙන් ඔබට ලැබුණු අත්දැකීම් දෙකක් ලියන්න.
   vi. මිනිසා හා සත්ත්වයා අතර පවතින වෙනස්කම් 02 ක් ලියන්න.
   vii. බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී මිතුරන්ගේ කේලම් කීම නිසා නොමග ගිය තරුණයා කවු ද?
   viii. ආජීව අෂ්ටමක ශීලයට අයත් ශික්ෂා පද දෙකක් ලියන්න.
   ix. බුදු දහමේ ඉගැන්වෙන යහපත් රැකියා වලින් දෙකක් ලියන්න.
   x. ආජීව අෂ්ටමක ශීලය අනුගමනය කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ලකුණු 2X10 = 20)

2)
   i. බුදුගුණ මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව කුමක් ද?
   ii. නව අරහාදී බුදු ගුණ අතරින් තුනක් ලියන්න.
   iii. "රහසත් පව් නො කොට" යනාදී කවිය සම්පූර්ණ කර තේරුම ලියන්න.

(ලකුණු 2+3+5 = 10)

3)
   i. මෙත් වඩන්නෙකු සතු ගුණාංග ඇතුළත් සූත්‍රය කුමක් ද?
   ii. මෙත් වඩන්නෙකු සතු ගුණාංග තුනක් ලියන්න.
   iii. මෛත්‍රී භාවනාවෙන් ලැබෙන සාමාජීය ප්‍රයෝජන පහක් ලියන්න.

(ලකුණු 2+3+5 = 10)

4)
   i. ධම්ම පදයේ ඇතුළත් ගාථා ගණන හා වග්ග ගණන කීය ද?
   ii. "අක්කොච්ඡි මං අවධි මං" යන ධම්ම පද ගාථා දෙකෙන් එක් ගාථාවක් ලියන්න.
   iii. ඔබ විසින් ලියන ලද ධම්ම පද ගාථාව ඇසුරින් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ පිළිබඳ කෙටියෙන් ලියන්න.

(ලකුණු 2+3+5 = 10)

5)
   i. සිගාලෝවාද සූත්‍රයේ ගුරුවරුන් දක්වා ඇත්තේ කුමන දිශාවට ද?
   ii. ගුරුවරුන්ගෙන් ශිෂ්‍යයන්ට ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න.
   iii. ගුරු සිසු සබඳතාවය මනාව පවත්වාගෙන යෑමෙන් යහපත් සමාජයක් බිහි වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

6)

i. බෝසතාණන් වහන්සේගේ ඉවසීමේ ගුණය පිළිඹිබු වන ජාතක කතාව කුමක් ද?
ii. බුද්ධ චරිතයෙන් ඉවසීමේ ගුණය ඉස්මතු වන අවස්ථා තුනක් දක්වන්න.
iii. ඉවසීමෙන් ඔබේ ජීවිතයට ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.

(ලකුණු 2+3+5 = 10)

7) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. විශාකා සිටු දේවිය
ii. කළගුණ සැලකීම
iii. පන්සලේදී අනුගමනය කරන සිරිත් විරිත්
iv. පංච සීලය

(ලකුණු 5+5 = 10)

REGISTRAR
De Mazenod College
Kandana.